# ආයුබෝවන්

# අධ්‍යාපන අමාත්‍යාංශයේ ආගමික හා සාරධර්ම ශාඛාව
# මගින් මෙහෙයවන
# 2022 අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා
# 45 බෞද්ධ ශිෂ්ටාචාරය - උපකාරක සම්මන්ත්‍රණය

# දේශන දායකත්වය:

කථිකාචාර්ය පූජ්‍ය මැටිබැඹියේ ධම්මසිරි හිමි

අධ්‍යාපනපති පූජ්‍ය උලහිටියාවේ විභාවි හිමි

ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්ගොල්ලෑවේ සුමනසාර හිමි

කථිකාචාර්ය ශ්‍රියානි හේමලතා මිය

ගුරු උපදේශක ආර්. ඒ. ගුණවර්ධන මයා

01. I. **ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් දෙකක් නම් කරන්න.**

- නිසි වයසේදී සුදුසු සහකාරියක් විවාහ කරගත යුතුය.
- විවාහයෙන් පසු පිරිමි දරුවන් ලැබ පරම්පරාව රැකගත යුතුය.
- පිරිමි දරුවෙකු ලබාගැනීම උදෙසා සිදුකරන පුංශවන යාගය සිදුකළ යුතුය.
- පස්කම් සැප විඳිමින් අතිශය කාමභෝගී ජීවිතයක් ගතකළ යුතුය.
- ගෘහීය ආගමික වතාවත් සිදුකළ යුතුය.
- තම වර්ණයට පැවරුණ ස්වධර්ම ක්‍රියාත්මක කළ යුතුය.

1. (II) යාගයක් අංගසම්පූර්ණවීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 3)

- මහා යාගයක් අංග සම්පූර්ණවීම සඳහා මූලික අවශ්‍යතා කිහිපයක් සම්පූර්ණවිය යුතුය.

1. බ්‍රාහ්මණ පූජකවරු හතර දෙනෙක් සිටිය යුතුය.

- හෝතෘ - දෙවියන්ට යාගය පිණිස ආරාධනා කරන පූජකයා
- උද්ගාතෘ - දෙවියන් සතුටුවන ලෙසින් වේද පාඨ ගායනා කරන අය
- අද්වර්යු - යාගයේ ප්‍රධානියා (යාගයේ අධ්‍යක්ෂ)
- යඥකාරක - යාගය කරන පූජකයා

(යාග උපකරන කොතරම් තිබුනත් බ්‍රාහ්මණ පූජකයන්ගෙන් තොර යාගය මහා බ්‍රහ්ම නොපිළිගන්නා බව)

2. සුබ නැකතින් කප (යාග ස්තම්භය) සිටුවා වේද ගීතිකා ගායනය ආරම්භ කිරීම

3. වේද ගීතිකා ගායනය ආරම්භයේ සිට අවසන් වන තුරු ගිනි පූජාව පැවැත්වීම

4. පූජාසනය මත පූජා ද්‍රව්‍ය (කැවිලි,පලතුරු,මල්,පහන්, සුවඳ) පූජා කිරීම

5. ඒ ඒ යාගයට ගැලපෙන බිලි පූජා පැවැත්වීම

## 01. (III) බ්‍රාහ්මණයන් විසින් කාන්තාව පුරුෂාධිපත්‍යයට නතු කළ අයුරු නිදසුන් හතරක් ඇසුරෙන් ගෙනහැර දක්වන්න.

1. **මනුස්මෘතියේ සඳහන් පරිදි ඇය නිතර ම පිරිමි පාර්ශ්වයට යටත් කොට තිබීම**

   "බාල්‍යෙ පිතුර්වශෙ තිෂ්ඨෙත් ප්‍රාණි ග්‍රාහසය යෞවනේ
   පුත්‍රාණාං භර්තරී ප්‍රේතේ න භජේත් ස්ත්‍රීස්වතන්ත්‍රනාම්"

2. **මල්වර වීමට පෙරාතුව විවාහ කරදීම**

   මනුස්මෘතියට අනුව තිස්වන වියට පත් අයෙකුට තමා පිනවන සොළොස් වියේ තරුණියක ද සූවිසි වියට පත් අයෙකුට අට හැවිරිදි තරුණියක ද ආවාහ කර ගත හැකිය.

   "ත්‍රිංෂද්වර්ෂෝද්වහේත් කන්‍යාං හෘද්‍යාං ද්වාදශවර්ෂිකීම්
   ත්‍ර්‍යෂ්ටවර්ෂෝෂ්ටවර්ෂාං වා ධර්මේ සීදති සත්වරඃ"

3. ස්වාමියා මළ පසු සති පූජාවට යොමු කිරීම

4. පර්ධා චාරිත්‍රය පැවැත්වීම

5. ස්වාමියා කෙරෙහි පතිභක්තියෙන් යුක්තව ක්‍රියාකළ යුතු බව
   නාස්ති ස්ත්‍රීනාං පෘථග්යඥො - නාව්‍රතම් නපයුපෝසථම්
   පතිං සුශ්‍රෑසතේ යේන - තේන ස්වර්ගෝ මහීයතේ (මනුස්මෘතිය)

6. ස්ත්‍රී ධනය ඕනෑම අවස්ථාවක අත්පත් කර ගැනීමේ හැකියාව ස්වාමියාට හිමිවීම

01. (IV) බුද්ධකාලීන භාරතයේ ප්‍රධාන ජීවන ක්‍රම අතර කෘෂිකර්මාන්තය පැවැති බවට සාධක පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

1. කෘෂිකර්මාන්තය දැහැමි ජීවන වෘත්තියක් ලෙස හඳුන්වාදීම (ව්‍යග්ඝපජ්ජ ආදී සූත්‍ර)
2. කෘෂිකර්මාන්තයට අනුග්‍රහ දැක්වීම රජුගේ ප්‍රමුඛ කාර්යයක් බව (දී.නි. කූටදන්ත ආදී සූත්‍ර)
3. කෘෂිකර්මය ක්‍ෂත්‍රිය වර්ණයේ කාර්යයක් බව (දී.නි අග්ගඤ්ඤ සූත්‍රයේ "කෙත්තානං අධිපති බෝ වාසෙට්ඨ ඛත්තියෝ")
4. බුද්ධකාලයේ විසූ රජවරුන්ගේ නම් කෘෂිකර්මාන්තයට අදාළ වන වචන ඇසුරෙන් යොදා තිබීම (සුද්ධෝදන,අමිතෝදන, ධෝතෝදන, මිතෝදන)

5. වප් මඟුල් උත්සවය රජුගේ සහභාගිත්වයෙන් සිදුකළ බව
6. දියුණු වාරිමාර්ග පද්ධතියක් තිබූ බව
7. ජලය බෙදාගැනීමේ ගැටලු ඇතිවීම (රෝහිණී නදිය)
8. ධර්ම දේශනා කිරීමේදී කෘෂි උපකරණ හා තදනුබද්ධ අංග උපමා වශයෙන් යොදාගත් බව (සද්ධා බීජං තපෝ වුට්ඨි - පඤ්ඤා මේ යුගනංගලං)
9. මගධ කෙතේ ආකෘතියට අනුව චීවරය සකස් කිරීම
10. බමුණන් පවා කෘෂිකර්මාන්තයේ යෙදී ඇති බව (කසීභාරද්වාජ සූත්‍රය)

## 01 (V) මක්ඛලීගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් පෙන්වා දෙමින් එයින් සමාජ සදාචාරයට සිදුවන හානිකර තත්ත්වය පැහැදිලි කරන්න.

### ඉගැන්වීම්

- සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හෝ හේතු ප්‍රත්‍යයයක් නැතැයි ඉගැන්වීම (අහේතු අප්‍රත්‍යයවාදි)
- ස්වභාව නියතියකට අනුව සත්ත්වයාගේ සසර ගමන හා විමුක්තිය සිදුවේ යැයි පැවැසීම (නියතිවාදියකු, අධිච්ච සමුප්පන්නවාදි)
- උත්සාහය, වීර්යය, අධිෂ්ඨානය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය ප්‍රතික්ෂේප කිරීම හා සියලු සත්ත්වයන්, සියලු ප්‍රාණීන් වීර්යය රහිත, බල රහිත, ස්ව කැමැත්තට අනුව කටයුතු කළ නොහැකි පිරිසක් ලෙස දක්වන බව

## බෞද්ධ මතය

- මෙම ඉගැන්වීම් මඟින් කර්ම විපාක බැහැර කෙරෙන නිසා මක්ඛලී ගෝසාල අකිරියවාදියකු ලෙස හැඳින්වීම

- සත්ත්වයාගේ කෙලෙසීම හා පිරිසිදු වීම හේතු ප්‍රත්‍යය රහිත ව සිදුවේ යයි මක්ඛලිගෝසාල ප්‍රකාශ කළ ද බුදුරජාණන් වහන්සේ සංයුක්ත නිකායේ මහාලි සූත්‍රයේ දී "අත්ථි මහාලි හේතු අත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය, සහේතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති ආදි වශයෙන් සත්ත්වයාගේ කෙලෙසීමට හා පිරිසිදු වීමට බලපාන කරුණු පැහැදිලි ව දක්වා ඇති බව

- සියලු ආකාරයේ නියතිවාදී ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම ("ඉමස්මිං සති ඉදං හෝති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති ..... ")
- බුදුදහම සචේතන ක්‍රියාවල වගකීම කර්තෘ වෙත ම පැවැරූ බව
- ගංගා මුවෙහි ගිල්වා තබන ලද කෙමිණ බොහෝ මත්ස්‍යයන්ගේ විනාශය පිණිස හේතු වන්නා සේ මක්ඛලී වනාහි බොහෝ මිනිසුනට අහිත, අවැඩ, ව්‍යසනය පිණිස ලෝකයෙහි උපන් මිනිස් කෙමිණ ලෙස හඳුන්වා ඇති බව

1 (I) ගෘහස්ථ ආශ්‍රමයට අයත් කාර්යන් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(II) යාගයක් අංග සම්පූර්ණ වීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 3)

(III) බ්‍රාහ්මණයන් විසින් කාන්තාව පුරුෂාධිපත්‍යයට නතු කළ අයුරු නිදසුන් හතරක් ඇසුරෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 4)

(IV) බුද්ධකාලීන භාරතයේ ප්‍රධාන ජීවන ක්‍රම අතර කෘෂිකර්මාන්තය පැවැති බවට සාධක පහක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(V) මක්ඛලී ගෝසාල ශාස්තෘවරයාගේ ඉගැන්වීම් පෙන්වා දෙමින් එයින් සමාජ සදාචාරයට සිදුවන හානිකර තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 6)

02 (i) බුදුරජාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නමින් හැඳින්වීමට හේතුවූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

1 අෂ්ට විද්‍යාවෙන් යුක්ත වූ හෙයින්

2 පසළොස්චරණ ධර්මයෙන් යුක්ත වූ හෙයින්

විද්දෑ නැණ අට ද
පසළොස් චරණ ගුණය ද
ඇතියෙන් එමුනි සඳ
පිරුණු විජ්ජාචරණ නම් ලද

(බුදුගුණ අලංකාරය, 264 පද්‍ය, 132 පිටුව)

## 02 (II) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය පිළිබිඹුවන අවස්ථා තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

- පියුමක් මඩෙහි ඉපිද, මඩ සහිත දියේ හැදී වැඩී, ජලයෙන් පෝෂණය ලැබී ජලය මතු පිටට පැමිණ එම ජලයේ නොගැටී සිටින්නේ යම් සේ ද, බුදුරජාණන් වහන්සේ ද කෙලෙස් සහිත මිනිසුන් අතර, ද්වේෂ සහිත මිනිසුන් අතර, අකුසල් සහිත මිනිසුන් අතර, ඉපදී හැදී වැඩී ඔවුන්ගෙන් වෙන්ව විරාගික, නික්ලේශී උත්තරීතර පුද්ගලයකු බවට පත්වූහ. එය බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය ලෙස හඳුන්වයි.

- බුද්ධ චරිතය තුළින් පද්මාකාර ජීවිතය පිළිබිඹු වූ අවස්ථාවක් ලෙස වරදට පොළඹවන අටියෙන් තණ්හා, රතී, රගා යන මාර දූවරුන් පැමිණ බුදුරජාණන් වහන්සේ ඉදිරිපිට අනග රැගුමක් ඉදිරිපත් කිරීම සඳහන් කළ හැකිය. බුදුරජාණන් වහන්සේ එම රංගනයන් දෙස බැලුම් මාත්‍රයක්වත් නොහෙළූ බව

- රූමත් වූ මාගන්දියා දියණිය සරසවා ගෙන පැමිණ විවාහ කරගන්නා ලෙස බුදුරජාණන් වහන්සේගෙන් අයැද සිටි අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඇය තම පාදයෙන්වත් ස්පර්ශ කිරීමට අකමැති බවය.

- අක්කෝස භාරද්වාජ බමුණා බුදුරජාණන් වහන්සේට බැණවැදුණු අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ ඔහුගේ බැණවැදීම අවසන් වන තෙක් නිහඬව සිටියහ. අවසානයේ බුදුරජාණන් වහන්සේ මතක් කළේ තමන් වහන්සේ ඔහුගේ බැනුම් බාර නොගන්නා බවත් ඔහුට ම එය බාර ගන්නා ලෙසත් දේශනා කළ බව
- අග්ගික භාරද්වාජ බමුණා බුදුරජාණන් වහන්සේට වසලයකු යැයි රළු වදනින් අමතද්දී බුදුරජාණන් වහන්සේ වසලයකු වන කාරණා ඔහුට දේශනා කළේ මෛත්‍රී සහගතව බව

❖ දොළොස් වැනි වස් කාලය වේරංජා නුවර උදය බමුණාගේ ආරාධනය මත වස් වැසූ අතර, වස් තුන් මාසය මුළුල්ලේම නිසි ආහාර උන්වහන්සේ ඇතුළු සංඝයාට නොලැබිණි. වස් අවසන බුදුරජාණන් වහන්සේ උදය බමුණාට දැනුම් දී නැවත වැඩම කළේ උන්වහන්සේ තුළ බමුණා පිළිබඳව කිසිදු ක්‍රෝධ සිතුවිල්ලක් නූපදවා ගනිමින් බව

02 (III) බුදුරජාණන් වහන්සේගේ මහාකරුණා ගුණය නිදසුන් හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

1 දරුවන්ට පිහිටවීම

2 කාන්තාවන්ට පිහිටවීම

3 මට්ටකුණ්ඩලී වැනි අයට පිහිටවීම

4 පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ වැනි අයට පිහිටවීම

5 භද්‍රවතිකා ඇතින්න වැනි සත්වයන්ට පිහිටවීම

02 (IV) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පහක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

❖ අනතිමානීකම
- තමන් විසින් ඉදි කළ ජේතවනාරාමයට ජේත කුමරුගේ නම යෙදීම

❖ නිර්ලෝභිත්වය
- සසුන වෙනුවෙන් පනස් හතර කෝටියක් වියදම් කොට ජේතවනාරාමය ඉදිකිරීම

❖ ශාසනික ළැදියාව
- බුද්ධ ප්‍රමුඛ සංඝයා උදෙසා නිතිපතා දන් පූජා කිරීම
- විහාරයට යන විට හිස් අතින් නොයෑම

❖ ඥාති හිතමිත්‍රාදීන් දහමට යොමු කිරීමට උත්සාහ ගැනීම

- තම කාල සිටු පුත්‍රයා දහමට යොමු කිරීම
- දියණියන්ගෙන් මහා සුභද්‍ර, චූල සුභද්‍රා සෝවාන් වීම
- කනිටු දියණිය වන සුමනා දාන ශාලාව භාරව ක්‍රියා කළ අතර ඇය සකෘදාගාමී තත්ත්වයට පත් වීම

❖ පරිත්‍යාගශීලීත්වය

- අනාථ අසරණ අයට පිහිට වීම නිසා අනාථපිණ්ඩික ලෙස හැඳින්වීම

2 (V) යහපත් රාජ්‍ය පාලන තත්ත්වයක් පවත්වාගෙන යාම සඳහා සප්ත අපරිහාණිය ධර්මවල උපයෝගිතාව සාකච්ඡා කරන්න. (ලකුණු 6)

1 නිතර රැස්වීම

2 සමගිව එක්රැස්ව සමගිව කටයුතු කොට සමගිව විසිර යාම

3 පෙර නොපැනවූ නීති නොපැනවීම හා පැනවූ නීති කඩ නොකිරීම හා පැරණි වජ්ජිධර්ම අනුගමනය කිරීම

4 වැඩිහිටියන්ට ගරුබුහුමන් කිරීම හා ඔවුන්ගේ වචනවලට සවන්දිය යුතු බව පිළිගැනීම

5 විවාහක හා අවිවාහක කාන්තාවන්ට කරදර නොකිරීම හා බලහත්කාරයෙන් වාසය නොකිරීම

6 වජ්ජි රාජ්‍යය ඇතුළත හා පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරු සත්කාර කිරීම හා ඒවා නඩත්තු කිරීම

7 රහතන් වහන්සේට පහසුකම් සැලසීම රටට පැමිණි රහතන් වහන්සේලාට එහි සුවසේ විසීමට සැලැස්වීම හා නොපැමිණි රහතන් වහන්සේලා වැඩම කරවා ගැනීම

02 (I) බුදුරජාණන් වහන්සේ විජ්ජාචරණ සම්පන්න නමින් හැඳින්වීමට හේතුවූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(II) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය පිළිබිඹුවන අවස්ථා තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(III) බුදුරජාණන් වහන්සේගේ මහාකරුණා ගුණය නිදසුන් හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(IV) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පහක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(V) යහපත් රාජ්‍ය පාලන තත්ත්වයක් පවත්වාගෙන යාම සඳහා සප්ත අපරිහාණිය ධර්මවල උපයෝගිතාව සාකච්ඡා කරන්න. (ලකුණු 6)

03 (I) "නපරේසං විලෝමානි" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.

(ලකුණු 2)

**"න පරේසං විලෝමානි - න පරේසං කතාකතං**

**අත්තනෝව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානි ච"**

(පුප්ඵ වග්ගය, ගාථාව 7)

03 (II) එම ගාථාවේ අර්ථය නිවැරදිව ලියන්න. (ලකුණු 3)

**තේරුම** :-අනුන්ගේ රළු පරළු කතාත්, අනුන් කළ නො කළ දේත් නො සෙවිය යුතුය. තමා කළ දේ ද නො කළ දේ ද සෙවිය යුතුය.

03. (i) "න භජේ පාපකේ මිත්තේ"යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න.

න භජේ පාපකේ මිත්තේ
න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ
භජේථ පුරිසුත්තමේ

(ලකුණු 02)

03. (ii) එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න.

පව්වූ, නරක මිතුරන් ඇසුරු නොකළයුතුය/ නොකරන්න.
අධම පහත් මිනිසුන් ඇසුරු නොකළයුතුය/ නොකරන්න.
කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළයුතුය/ කරන්න.
උතුම් මිනිසුන් ඇසුරු කළයුතුය/ කරන්න.

(ලකුණු 03)

## 03 (III) ස්වාමි - භාර්යා යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4)

01 බිරිඳට ගරුකිරීම - සම්මානනාය

02 අවමන් නො කිරීම - අනවමානනාය

03 අනාචාරයේ නො හැසිරීම - අනතිචරියාය

04 සම්පත් පවරාදිම - ඉස්සරියවොස්සග්ගේන

05 අලංකාර වස්ත්‍රාභරණ සපයා දිම - අලංකාරානුප්පදානේන

01 ගෘහකටයුතු මැනවින් සංවිධානය කිරීම - සුසංවිහිත කම්මන්තා

02 ඇසුරු කරන පිරිවර ජනයාට මැනවින් සංග්‍රහ කිරීම -සුසංගහිත පරිජනා

03 අනාචාරයේ නො හැසිරීම - අනතිචාරිනී

04 ස්වාමියා උපයන ලද ධනය ආරක්‍ෂා කිරීම - සම්භතං අනුරක්ඛති

05 සියලු කටයුත්තක ම දක්‍ෂ හා අනලස් වීම - දක්ඛා ච හෝති අනලසා

සබ්බකිච්චේසු

3. (i) "න භජෙ පාපකෙ මිත්තෙ" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)

(ii) එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03යි.)

(iii) දෙමාපිය-දූ දරු යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04යි.)

(iv) පුද්ගලයාගේ පරිහානියට හේතුවන පරාභව සූත්‍රාගත කරුණු පහක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු හයක් පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 06යි.)

03 (IV) "නිද්දාසීලි සභාසීලි අනුට්ඨාතා ච යෝනරෝ " යන ගාථාවේ ඇතුළත් පුද්ගලයෙකු පිරිහීමට හේතුවන කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 5)

- පුද්ගලයකු පිරිහීමට පත් වන කාරණා පරාභව සූත්‍රයේ දැක්වෙන බව
- නිද්දාසීලි සභාසීලී ගාථාවේ පිරීමට හේතු වන කරුණු 5ක් සඳහන් වන බව
    - නිද්දාසීලි - නිතර නිදන සුලු බව
    - සභාසීලි - පිරිස් සමග එකට කතා කර සිටීම
    - අනුට්ඨාතා ච - උට්ඨාන වීර්යයෙන් තොර වීම
    - අලසෝ - අලසකමින් කටයුතු කිරීම
    - කෝධ - ක්‍රෝධ බහුල වීම
    - මෙම කරුණකින් හෝ කරුණු රාශියකින් සමන්විත පුද්ගලයා හා සමාජය පිරිහීමට ලක්වීම

- නියමිත කාර්යයන් අතපසු වීම
- වගකීම් පැවරිය නොහැකි වීම
- විශ්වාසය බිඳ වැටීම
- රෝගීවීම
- උපයන ලද ධනය විනාශ වීම හා නැවත ධනයක් නොලැබීම
- බොහෝ දෙනාගේ අප්‍රසාදයට ලක්වීම
- නිවැරදිව කටයුතු නොකිරීම

## 03 (V) ශ්‍රද්ධාව පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුන්වන්න. (ලකුණු 6)

- බුද්ධ, ධම්ම, සංඝ යන තුන් රුවන කෙරෙහි යමකු තුළ පවත්නා අවබෝධය, පැහැදීම යි.

- පින් පව් පිළිබඳ යමකුගේ සිතේ පවතින අවබෝධය, පැහැදීම ශ්‍රද්ධාව යි.
- ශ්‍රද්ධාව පිළිබඳ ව විවිධ අර්ථ නිරූපණ හඳුනාගත හැකි ය.
- ශ්‍රද්ධාව යනු රත්නත්‍රය කෙරෙහි ඇති කර ගන්නා විශ්වාසය නිසා ඇති වන කුසල චේතනාවයි. (අත්ථසාලිනී අටුවාව)
- පත්තකම්ම සූත්‍රයේ ශ්‍රද්ධාව හඳුන්වන්නේ, "සද්දහති තථාගතස්ස බෝධිං"

"තථාගතයන් වහන්සේ සත්‍යාවබෝධය ලැබුයේ යැයි කෙනෙකුගේ සිතේ පවතින ඇදහීම හෙවත් පැහැදීම ශ්‍රද්ධාවයි."

- සප්ත ආර්ය ධනය අතර පළමු වැන්න ශ්‍රද්ධාවයි.
- කසීභාරද්වාජ සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ ශ්‍රද්ධාව බීජයකට සමාන කරයි. (සද්ධා බීජං)
- අන්‍ය ආගම්වල ශ්‍රද්ධාවට සමානව දක්වන්නේ භක්තිය යි. එය ප්‍රේමය, ඇලීම, පිළිගැනීම යන අර්ථයන්ගෙන් ද හඳුන්වයි.

- ශ්‍රද්ධාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.
  1. අමූලිකා ශ්‍රද්ධාව
  2. ආකාරවතී ශ්‍රද්ධාව

- අමූලිකා ශ්‍රද්ධාව යනු මෝඩ ශ්‍රද්ධාව හෙවත් පදනම් විරහිත ශ්‍රද්ධාවයි.

- අවබෝධයකින් තොරවූ විශ්වාසය, පැහැදීම ආදි මනෝභාව මෙමගින් අර්ථවත් වේ. භක්තියෙන් හෝ විශ්වාසයෙන් හෝ විමුක්තිය ලද නොහැකි ය. ඒ නිසා බුදුදහම අමූලිකා ශ්‍රද්ධාව බැහැර කර තිබේ.

- ආකාරවතී ශ්‍රද්ධාව යනු බුද්ධිගෝචර ශ්‍රද්ධාව යි. නොඑසේ නම් ඤාණ පූර්වක ශ්‍රද්ධාව යි. බුද්ධාදී රත්නත්‍රයේ ගුණයන් දැන ඒ කෙරෙහි අවබෝධයකින් යුතුව ඇතිකරගන්නා වූ පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව නම් වේ.

- ❖ බුදුසමයේ ශ්‍රද්ධාව හා ප්‍රඥාව එකට බැඳී පවතී. ශ්‍රද්ධාවෙන් තොර ප්‍රඥාවත්, ප්‍රඥාවෙන් තොර ශ්‍රද්ධාවත් බුදුදහම නො පිළිගනියි. බෞද්ධ ආර්ය මාර්ගයේ ආරම්භය ශ්‍රද්ධාවයි. එය අවසාන වන්නේ ප්‍රඥාවෙනි. ඒ බව ආර්ය මාර්ගය දැක්වෙන පහත සඳහන් සටහන් දෙකෙන් පැහැදිලි ය.
  - ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා
  - ශ්‍රද්ධා, ශීල, ස්මෘති, සමාධි, ප්‍රඥා
- ❖ ආර්ය මාර්ගය ශ්‍රද්ධාවෙන් ආරම්භ වී ප්‍රඥාවෙන් අවසාන වන බව

- ශ්‍රද්ධාවේ ප්‍රභේද
    1. සම්පසාදන ලක්ඛණ ශ්‍රද්ධා
    2. සම්පක්ඛන්දන ලක්ඛණ ශ්‍රද්ධා

- ත්‍රිවිධ රත්නයෙහි ගුණයන් අවබෝධ කර ගැනීමටත්, අකුසල ධර්මයන්ගෙන් අපිරිසිදු සිත පිරිසිදු කිරීමටත්, කුසල් අකුසල් වෙන් කර හඳුනා ගැනීමටත් හැකි වන්නේ සම්පසාදන ලක්ඛණ ශ්‍රද්ධාවෙනි.

- නිවන් මගට බාධා පමුණුවන්නා වූ පංච නීවරණයන්ගෙන් මිදීම සිදු කරන ශ්‍රද්ධාව සම්පක්ඛන්දන ශ්‍රද්ධාවයි. මෙසේ නීවරණ ධර්මයන් ප්‍රහීණ කොට සසරෙන් එතෙර වීමට උපකාරී වන්නේ මෙම සම්පක්ඛන්දන ශ්‍රද්ධාවයි.

- "චල ශ්‍රද්ධා" හා "අචල ශ්‍රද්ධා" යනුවෙන් ද ශ්‍රද්ධාවේ තවත් ආකාර දෙකකි. පෘථග්ජනයන් තුළ ඇති වන ශ්‍රද්ධාව චල ශ්‍රද්ධාව නම් වේ. එය නිතර නිතර වෙනස් වන හැඟීම්වලින් යුක්ත ය.
- තෙරුවන් හා කර්මඵල ආදිය පිළිබඳ ව සැක උපදියි. මෙසේ අස්ථිර, වෙනස් වන, සැකයට භාජනය වන තත්ත්වය නිසා මේ ශ්‍රද්ධාව චල ශ්‍රද්ධාව ලෙස හැඳින්වේ
- සෝවාන්, සකෘදාගාමී ආදි වූ මාර්ගඵලයන්ට ලක් වූවන්ට ඇති වන්නේ අචල ශ්‍රද්ධාවයි. මෙය ආගම ශ්‍රද්ධා යනුවෙන් ද හඳුන්වයි. මෙය ඉන්ද්‍රඛීලයක් මෙන් නො සැලී ස්ථිර ව පවතී. සෝවාන් වූ පසු නිවන් ලබාගැනීමේ නිවැරදි මාර්ගයට යොමු වේ. ඒ නිසා එම ශ්‍රද්ධාව යළි වෙනස් නො වේ. එබැවින් අචල ශ්‍රද්ධාව නම් වේ.

- ශ්‍රද්ධාවන්තයකු තුළ පවත්නා ලක්ෂණ කිහිපයකි. එනම්,

    ධර්මය ඇසීමට ඇති කැමැත්ත
    සිල්වතුන් දැකීමට ඇති කැමැත්ත
    මසුරු බවින් තොර ත්‍යාගශීලීබව
    සිල්වත්බව ආදි ගුණාංග ය.

- ශ්‍රද්ධාව ලෝකෝත්තර ජීවිතයට පමණක් නොව ලෞකික ජීවිතයට ද වැදගත් වන්නේ එමගින් මනා චරිත සංවර්ධනයක් ඇති කරන බැවිනි. හික්මීම, සංවරය, සීලය ආදි චර්යා ධර්ම එමගින් වැඩි දියුණු වේ.

03 (I) **"නපරේසං විලෝමානි"** යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 2)

(II) එම ගාථාවේ අර්ථය නිවැරදිව ලියන්න. (ලකුණු 3)

(III) ස්වාමි භාර්යා යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4)

(IV) "නිද්දාසීලි සභාසීලි අනුට්ඨාතාච යෝනරෝ " යන ගාථාවේ ඇතුලත් පුද්ගලයෙකු පිරිහීමට හේතුවන කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 5)

(V) ශ්‍රද්ධාව පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුන්වන්න. (ලකුණු 6)

# II කොටස

## 04 (I) නිදහස් චින්තනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සමකාලීන ඉගැන්වීම්වලින් වෙනස් වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

- "සැම දෙනාට ම නිදහසේ සිතීමටත් හෘදය සාක්ෂ්‍යයට අනුව යුතු අයුතුකම් සලකා ගැනීමටත් ආගම ඇදහීමටත් අයිතියක් ඇත. මේ අයිතියෙහි සිය ආගම හෝ ඇදහීම හෝ වෙනස් කිරීමේ නිදහස ද තනි තනි වැ ම හෝ අනුන් හා සාමූහික වශයෙන් ද ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික වශයෙන් ද, උගැන්වීමෙන් ද, අනුශීලනයෙන් ද පුද සිරිත් පැවැත්වීමෙන් ද, පිළිපැදිමෙන් ද සිය ආගම හෝ ඇදහීම හෝ ප්‍රකාශ කිරීමෙහි නිදහස ඇතුළත් ය.

- උපාලි සූත්‍රය

  "අනුවිච්චකාරං ඛෝ ගහපති කරෝහි. අනුවිච්චකාරෝ තුම්හාදිසානං ඤාතමනුස්සානං සාධු හෝතීති"

  "ගෘහපතිය, ඔබ වැනි අය විමසා කටයුතු කළ යුතු ය. විමසා බලා ක්‍රියා කිරීම ඔබ වැනි ප්‍රසිද්ධ පුද්ගලයනට වඩාත් වැදගත් වේ"

- කාලාම සූත්‍රය

1 මා අනුස්සවේන - යමක් ඇසූ පමණින් නො පිළිගත යුතුය
2 මා පරම්පරාය - පරම්පරාවෙන් පැවතගෙන එන නිසා නො පිළිගත යුතුය
3 මා ඉතිකිරාය - මෙය මෙසේ වී යැයි ආරංචි මාත්‍රයෙන් හෝ නො පිළිගත යුතුය
4 මා පිටකසම්පදානේන - පොත්පත්වල පැවති හෙයින් නො පිළිගත යුතුය
5 මා තක්කහේතු - තර්කයට ගැළපෙන පමණින් හෝ නො පිළිගත යුතුය
6 මා නය හේතු - න්‍යායට ගැළපෙන පමණින් හෝ නො පිළිගත යුතුය

7 මා ආකාරපරිවිතක්කේන - තමා සිතූ ආකාරයට ගැළපෙන පමණින් ද නො පිළිගත යුතුය.

8 මා දිට්ඨි නිජ්ඣානඛන්තියා - තම දෘෂ්ටියට ගැළපෙන පමණින් ද නො පිළිගත යුතුය.

9 මා භබ්බරූපතාය - මා වැන්නකු මෙසේ පිළිගැනීම සුදුසු යැයි ද නොපිළිගත යුතුය.

10 මා සමණෝ නොගරූත - මේ ශ්‍රමණයෝ අපගේ ගුරුවරයෝ යැයි කියා හෝ යමක් නො පිළිගත යුතුය.

- සතර මහාපදේශ

  ශ්‍රාවකයාට සාවද්‍යතාව හා නිරවද්‍යතාව හඳුනා ගැනීම සඳහා තමාගේ ම බුද්ධිය භාවිත කරලීමට අවසරය ලබාදුන් ආකාරය

1 මේ ධර්ම විනය මා විසින් බුදුරදුන්ගෙන්ම අසාගන්නා ලදැයි කීව ද?
2 මහා සංඝයා වහන්සේලාගෙන් අසාගත්හ, ලදැයි කීව ද?
3 බොහෝ භික්ෂුන් වහන්සේලාගෙන් අසාගත්හ, ලදැයි කීව ද?
4 ධර්ම විනයධර මතිකාධර භික්ෂු නාමකගෙන් අසාගන්නා ලදැයි කීව ද?

එසේ නොකළ යුතු බව

- වීමංසක සූත්‍රය

“වීමංසකේන භික්ඛවේ භික්ඛුනා පරස්ස චේතෝපරියායං අජානන්තේන තථාගතෝ සමන්නේසනා කාතබ්බා සම්මා සම්බුද්ධෝ වා නෝවා ඉති විඤ්ඤාණායාති”

- විචාරපූර්වක ව ක්‍රියා නොකරන්නාගේ ආධ්‍යාත්මික ප්‍රගතියක් ඇති නොවන බව ("න චින්තයන්තෝ පුරිසෝ විසේසමධිගච්ඡති")

- ධර්ම රත්නයේ ගුණ සඳහන් "ස්වාක්ඛාතෝ" වශයෙන් ආරම්භ වන ගාථාවෙහි "ඒහි පස්සිකෝ" යන වචනයේ ද අර්ථ ගැන්වෙන්නේ විමසීමේ නිදහස යි. කවරකුට වුව ද ධර්මය ඇවිත් බලන්න යැයි නිර්දේශ කිරීමක් ඒ මගින් සිදු කර ඇත.

- යමක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නිදහස් මනසකින් විචාරපූර්වක ව සිදු කළ යුතු ය යන්න බුදුදහම අවධාරණය කරයි
- බුද්ධකාලීන භාරතීය සමාජය තුළ මේ මතය ප්‍රබල ව ඉදිරිපත් කළේ බ්‍රාහ්මණ ආගම යි. ඒ අනුව මහා බ්‍රහ්ම හෙවත් ඊශ්වර නම් වූ මැවුම්කාර දෙවියන් වහන්සේ ලෝකය හා සත්ත්වයා මවා වදාළ බැවින් ඔවුන් පිළිබඳ තීරණ ගැනීමේ ඒකාධිකාරී බලය ඇත්තේ එම මැවුම්කාර දෙවියන් වෙත බව පිළිගැනිණි.
- පුද්ගලයා සමාජයෙහි හැසිරිය යුත්තේ දේව නියමයට අනුකූල වන අයුරිනි. මේ යටතේ පුද්ගලයාගේ සමාජීය, දේශපාලන හා ආර්ථික තත්ත්වය තීරණය කළ ප්‍රධාන තීරකයා වූයේ මැවුම්කාර දෙවියාය.

## 04 (II) සමාජ හිතකාමී පරිසරයක් බිහිකර ගැනීමට දස පුණ්‍යක්‍රියා උපකාර වන ආකාරය විමසීමට ලක් කරන්න. (ලකුණු 10)

**දස පුණ්‍ය ක්‍රියා හෙවත් දස පින් කිරියවත්**

දානං සීලං ච භාවනා පත්ති පත්තානුමෝදනා
වෙය්‍යාවච්ච පචායං ච දේසනා සුති දිට්ඨිජු

1. දානය
2. සීලය
3. භාවනාව
4. පත්තිදාන - පින්දීම
5. පත්තානුමෝදනා - පින් අනුමෝදන් වීම
6. වෙය්‍යාවච්ච - වතාවත් කිරීම
7. අපචායනය - පිදිය යුත්තන් පිදීම
8. දේසනා - ධර්මය දේශනා කිරීම
9. සුති - ධර්මය ශ්‍රවණය කිරීම
10. දිට්ඨිජුකම්ම - නිවැරදි දැක්ම

දානය : තමා සතු දේ පරිත්‍යාග කිරීම

දානයේ ප්‍රභේද 2යි.

1. පූජා බුද්ධියෙන් දෙන දානය
   (සීලාදි ගුණයෙන් යුතු උතුමන්ට)
2. අනුග්‍රහ බුද්ධියෙන් දෙන දානය
   (දුගී මගී, යාචක, අසරණ පුද්ගලයන්ට)

- ධනය, බුද්ධිය, ශ්‍රමය කැප කිරීමෙන් සිදුකරනු ලබන දානය තෙවැදෑරුම් වර්ගීකරණයකට ලක් කළ හැකි ය. එනම්,

1 ආමිස දානය

(උපකරණ ආදිය භාවිතයෙන් තම ශ්‍රමය කැප කොට යමක් ප්‍රාර්ථනා කොට සිදු කරනු ලබන පරිත්‍යාගය)

2 අභය දානය

(යමකු තුළ ජනිත වන්නා වූ බිය දුරු කොට නිර්භය කිරීම)

3 ධර්ම දානය

(දුසිරිතෙන් මුදවා සුසිරිතයෙහි යෙදවීම)

සීලය : කායික වාචසික සංවරය සීලය යි. සීලයේ ප්‍රභේද 2කි.

1. චාරිත්‍ර ශීලය (සමාදානය)

2. වාරිත්‍ර ශීලය (විරමණය)

- සීලය යනු කායික වාචසික සංවරය වේ. එබැවින් සීලය මගින් පුද්ගල චර්යාමය වෙනසක් ඇති වේ

1 චාරිත්‍ර සීලය (සමාදානය 'සිරිත')

2 වාරිත්‍ර සීලය (විරමණය හෙවත් වැළකීම 'විරිත')

**භාවනා :- කුසල දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාව යි.**

**භාවනාවේ ප්‍රභේද 2කි.**

1. සමථ භාවනාව
2. විදර්ශනා භාවනාව

- භාවනාව බුදු දහමෙහි නිර්වාණ මාර්ගය පිණිස ප්‍රමුඛ වන ඉතා වටිනා ක්‍රමවේදයකි. එමගින් සිත එක් අරමුණක පිහිටුවා, සිත දියුණු කිරීම සිදු වේ.
- "භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති එතායාති භාවනා"

"කුසල් දහම් වැඩිදියුණු කිරීමට මානසික අභ්‍යාසය භාවනාව යි."

- සමථ භාවනාව මගින්
  - සිත සමාධි ගත කරගැනීම ඔස්සේ සිත එක් අරමුණක පිහිටුවා ගත හැකි ය.
  - සිත කිලිටි කරන, කෙලෙස් සිතිවිලි එමගින් පාලනය කෙරේ
  - අතෘප්තිමත්භාවය වෙනුවට තෘප්තිමත්භාවය වැඩිදියුණු වේ
  - අසහනය වෙනුවට ප්‍රසන්න බවක් ඇති වේ
  - ධාරණ ශක්තිය වර්ධනය වේ
  - කායික, මානසික රෝග පීඩා සමනය වී නීරෝගකම වර්ධනය වේ

- විදර්ශනා භාවනාව මගින්
  - ජීවිතයේ අත්විඳින්නා වූ සියළුම සංස්කාර ධර්මයන් අනිත්‍යබව එනම් වෙනස් වන
    සුළු බව
  - එම වෙනස්වීම නොවැළැක්විය හැකි බව
  - එම වෙනස් වීම නිසා ම එය දුක් සහිතබව
  - සදාතනික ව පවත්නා කිසිවක් ලොව නොමැතිබව

අවබෝධ කරගැනීම නිසා පසුතැවීම හෝ අටලෝ දහමින් කම්පා වීමක් සිදු නො වේ.

- **පත්තිදාන : පින් දීමයි. පින් අනුමෝදන් කරවීමයි**
  **දෙවියන්ට මියගිය, ඥාතින්ට පින් දීම**

- තමා විසින් කරනු ලැබූ පින් අනුන්ට දීමයි
- මෙය කළ හැක්කේ නිර්ලෝභී මනසකින් යුත්, යහපත් ගුණධර්මයන්ගෙන් සාරපෝෂී වූ පුද්ගලයකුට පමණි
- යහපත් ක්‍රියාවට ඍජුව ම හා සක්‍රීය වශයෙන් ස්වකීය දායකත්වය ලබා දීමක් අනෙක් පාර්ශ්වයෙන් සිදු නොවුණ ද එම පුද්ගලයා සිතින් සම්බන්ධ කොටගෙන තමා කළ පින එම තැනැත්තාට පිරිනමයි. දෙවියන්ට හා මියගිය ඥාතීන්ට පින් දීම බෞද්ධ ජීවිතයේ සුලභ ව දකිය හැකි අවස්ථා වේ.

- **පත්තානුමෝදනා : අන්‍යයන් විසින් කරන ලද පින් තමා ද අනුමෝදන් වීමයි.**

**අන් අය කළ යහපත් ක්‍රියා අගය කොට ප්‍රශංසා කොට ඊට තම දායකත්වය ලබා දීම**

- යම් පුද්ගලයකු විසින් සිදු කරනු ලබන යහපත් ක්‍රියාවකට කවරාකාරයෙන් හෝ තම දායකත්වය ලබාදීම මගින් එම පින තමා ද අනුමෝදන් වේ.
- නිදසුන් වශයෙන් යමකු දානයක් දෙනවිටදී ඒ සඳහා තම කායික, මානසික ශ්‍රමය කැප කරමින් ලබා දෙන දායකත්වය මගින් තමා ද පින් අනුමෝදන් වෙයි.

- පත්තානුමෝදනාව මගින් සමාජයීය යහපත් ක්‍රියාවන්ට දිරි දීම, සහය දීම හරහා සිදු කෙරෙනුයේ සමාජ සත්කාරයකි. එය හුදු ආත්මාර්ථයෙන් ඔබ්බට ගිය පරාර්ථය අරමුණු කොටගත් ක්‍රියාවලියකි

- එබැවින් අන්‍යයන් විසින් සිදු කරනු ලබන යහපත් ක්‍රියාවන් ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර ඇති කරගනිමින් තම සිත කිලිටි මළින් දූෂණය කරගනු වෙනුවට අනුන්ගේ යහපත් ක්‍රියාවන් දෙස සතුටු වීම මගින් සිදු වනුයේ මානසික පිබිදීමකි.

- වචනයෙන් එහි ගුණ වැනීම මගින් ඊට ශ්‍රමයෙන් සහාය දීම හා ශාරීරික ව සහභාගී වීමට නොහැකි වුවත් තමාට එම පින් කටයුතු සඳහා දායක විය හැකි ය. සාමූහික ප්‍රයත්නයක් මගින් ගුණගරුක සමාජයක් බිහි කිරීමට බෞද්ධයන් වශයෙන් සැවොම කොටස් කරුවන්, මැදිහත් කරුවන් වීමෙහි සමාජීය අවශ්‍යතාව මෙමගින් සපිරේ.

## වෙය්‍යාවච්ච :- වතාවත් ඉටු කිරීමයි. විහාරස්ථානවල දී ආගමික වතාවත් කිරීම, පාසලෙහි වත් පිළිවෙත් කිරීම

- දෛනික ජීවිතයේදි පුද්ගලයන් විසින් ඉටු කළ යුතු කාර්යයන් සමුදායක් පවතින අතර එම ඉටු කළයුතු කාර්යයන් ඒ ඒ ස්ථානය හා අවස්ථානුගත කරුණු අනුව එකිනෙකට වෙනස් වේ.
- නිදසුන් වශයෙන් ආගමික වතාවත් ඉටු කිරීමට ප්‍රථමයෙන් සිදු කළ යුතු වත් පිළිවෙත් සලකා බැලීම වැදගත් වේ. බෞද්ධයකු වශයෙන් ආගමික වතාවත් ඉටු කිරීමට ප්‍රථමයෙන් බෝ මළුව හා විහාරය ඇමදිම, පර මල් ඉවත් කිරීම ආදිය සිදු කළ යුතු ය. එසේ වතාවත් ඉටු නො කිරීමෙන් ශීලය පූර්ණත්වයට පත් නො වේ. එය බුදුදහමේ,

  "වත්තං න පරිපූරෙන්තො න සීලං පරිපූරති " ලෙස සඳහන් වේ.

- ගිහි ශිෂ්‍ය - ශිෂ්‍යාවන් නම් අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමයෙන් පාසලෙහි සිදු කරනු ලබන පවිත්‍රතා කටයුතු මෙම ගණයට ඇතුළත් වේ.
- මෙමගින් යම්කිසි ක්‍රියාවක් නිසි කාර්ය පටිපාටියකින් යුක්ත ව, ඉතා පිළිවෙළට සිදු කිරීමෙහි ආදර්ශය පිළිබිඹු කොට ඇත.

## අපචායනය : පිදිය යුත්තන් පිදීමයි

- පිදිය යුත්තන් පිදීම 'අපචායන' යන්නෙන් අර්ථවත් වේ. පිදිය යුත්තන් තුළ පැවතිය යුතු ගුණාංග බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළහ. ඒ අනුව,

| | | |
|---|---|---|
| ශීල වෘද්ධ | - | සීලයෙන් වැඩි |
| ගුණ වෘද්ධ | - | ගුණයෙන් වැඩි |
| තපෝ වෘද්ධ | - | තැන්පත්බවින් වැඩි |
| වයෝ වෘද්ධ | - | වයසින් වැඩි |
| ඥාන වෘද්ධ | - | නුවණින් වැඩි |

පුද්ගලයෝ 'පිදිය යුත්තන්' වශයෙන් සැලකෙති.

**දේසනා :- ධර්මය දේශනා කිරීමයි. ධර්මය දේශනා කිරීමෙන් පුද්ගලයාට යහපත් මාර්ගය පෙන්වා දෙයි.**

- 'ධම්මදේසනා' හෙවත් ධර්මය දේශනා කිරීම මගින් අන්‍යයන් යහමගට යැවීමේ සත්කාර්යය සිදු වේ. පවෙහි ඇලී ගැලී වසන්නෙකුට නිවැරදි, යා යුතු මාර්ගය පෙන්වා දෙමින් යහපත් මාර්ගය අනුශාසනා කරන්නෝ දුර්ලභ වෙති. එහෙත් කාලීන වශයෙන් 'ධර්ම සාකච්ඡා' පැවැත්වීම ද මංගල කරුණක් වශයෙන් මහා මංගල සූත්‍රයෙහි සඳහන් වේ.

"කාලේන ධම්ම සාකච්ඡා - ඒතං මංගල මුත්තමං"

**සුති** :- ධම්මසවණ ධර්මය ශ්‍රවණය කිරීමයි. නොදත් දහම් කරුණු දැන ගැනීමටත් දන්නා දහම් කරුණු තහවුරු කර ගැනීමටත් හැකි වේ

- මහා මංගල සූත්‍රයෙහි, "කාලේන ධම්මසවණං - ඒතං මංගල මුත්තමං" වශයෙන් දක්වා ඇත්තේ ද "සුදුසු කල ධර්ම ශ්‍රවණය කිරීම මංගල කරුණක්" වන බව ය.
- ධර්මය දේශනා කිරීම මෙන්ම දේශනා කරන ලද ධර්මය ශ්‍රවණය කිරීම ද පුණ්‍ය ක්‍රියාවකි. මනස එක් අරමුණක පිහිටුවා යමක් ධාරණය කරවීම මෙමගින් අරමුණු කෙරේ. දුසිරිතට යොමු වූවන් සුසිරිතෙහි යෙදවීම පිණිස මාහැඟි මාර්ගයක් වශයෙන් 'ධම්මසවණ' හඳුනාගත හැකි ය.
- යමෙක් එපරිද්දෙන් වරදින් මුදවා ගැනීමට යහපත් දෑ අනුශාසනා කරයි ද එම තැනැත්තා 'නිධානයක් පෙන්වා දෙන්නකු' සේ සලකා එම අනුශාසනය ඉතා ඉහළින් පිළිගත යුතුබව බුදුදහමේ සඳහන් වේ.

දිට්ඨිජුකම්ම :- වැරදි දෘෂ්ටියෙන් මිදී නිවැරදි දැක්මක් ඇති කර ගැනීම සරු දේ සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් දැකීම

- 'සම්මා දිට්ඨි' යනු කර්මඵල පිළිබඳ නිවැරදි දැකීම හා දුක්ඛ, දුක්ඛ සමුදය, දුක්ඛ නිරෝධ, දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්ය සත්‍යය යන චතුරාර්ය සත්‍යය නිවැරදි ව දැකීම වේ.
- මෙම නිවැරදි දැකීම තමා විසින් ම නුවණින්, සිතා විමසා ළඟා කරගත යුත්තකි. කාලාම සූත්‍රයෙහිදී "මා අනුස්සවේන" එනම්, "කිසිවකු කී පමණින් නො පිළිගන්න" යනුවෙන් බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේ චින්තන වීමංසන නිදහස ද අගයමින් නිවැරදි දෘෂ්ටිය ළඟා කරගත යුතු ආකාරය දේශනා කොට වදාළහ.

- විචාර පූර්වක ව නුවණින් සිතා බලා, විමසා කුසල - අකුසල, හොඳ - නරක, පින් - පව් ආදිය පිළිබඳ වැටහීමක් ඇති කරගත් පුද්ගලයා ‘දිට්ඨිජුකම්ම’ හෙවත් ‘වැරදි දෘෂ්ටියෙන්’ අත්මිදීම ළඟා කරගනී. මෙබඳු නිවැරදි දැකීමක් ඇති සැදැහැවත් නුවණැති පුද්ගලයන් හේතුවෙන් සමාජය ගුණගරුක වේ.
- පූර්වෝක්ත දස පින්කිරියවත් සිදු කිරීම මගින් තනි පුද්ගල හා සමාජීය වශයෙන් ද ගුණධර්ම වර්ධනය වේ. එලෙස සදාචාර, ගුණධර්මයන්ගෙන් ආඪ්‍ය වූ සමාජය ජනහිතකාමී වේ. සුවපහසු වේ. එබැවින් දශ පුණ්‍ය ක්‍රියා ලෞකික හා ලෝකෝත්තර වශයෙන් ද මෙලොව හා පරලොව වශයෙන් ද යහපත් ප්‍රතිවිපාක ජනනය කරවන සුවිශේෂ බෞද්ධ ඉගැන්වීම් වේ.

04 (i) නිදහස් චින්තනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම සමකාලීන ඉගැන්වීම්වලින් වෙනස් වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සමාජ හිතකාමී පරිසරයක් බිහිකර ගැනීමට දස පුණ්‍ය ක්‍රියා උපකාර වන ආකාරය විමසීමට ලක් කරන්න. (ලකුණු 10)

05 (i) අල්පේච්ඡතාව, සන්තුට්ඨිය හා සුභරතාව යන සංකල්පවල කාලීන වැදගත්කම පිළිබඳ ධර්මානුකූල විවරණයක් කරන්න (ලකුණු 10)

- අල්පේච්ඡතාව යනු අල්ප + ඉච්ඡ යන්න යි. එනම් අඩු අපේක්ෂා සහිත වීම යි. අඩු බලාපොරොත්තු සහිත වීම යි.
- ආශාවන් සීමා කරගැනීම, අපේක්ෂා, බලාපොරොත්තු අවම මට්ටමකින් පවත්වාගෙනයාම, බොහෝ සැප සම්පත් අපේක්ෂා නො කිරීම, අවම පරිභෝජනයෙන් තෘප්තිමත් වීම අල්පේච්ඡතාව නම්වේ.
- මහිච්ඡතාව මෙයට ප්‍රතිවිරුද්ධ වචනයයි. එය පුද්ගලයාගේ හා සමාජයේ පැවැත්මට බෙහෙවින්ම අහිතකර තත්වයකි.

- දැහැමි වූත් ශිෂ්ටසම්පන්න වූත් මානසික තෘප්තිය සන්තුෂ්ටිතා නමින් හැඳින්වේ.
- මෙය යථාලාභ සන්තුට්ඨිය හෙවත් ලද දෙයින් තෘප්තිමත්වීම ලෙස අර්ථ දැක්විය හැකිය.
- බුදුදහම තුළ සන්තුට්ඨිය පරම ධනයක් ලෙස දක්වා ඇත. "සංතුට්ඨි පරමං ධනං" යන්නෙන් එය පැහැදිලි කෙරේ.
- සන්තුෂ්ටයනට මිස අසන්තුෂ්ටයන්ට නොවන බව දේශනා කර ඇත.
- "අප්පිච්ඡාසයං ධම්මෝ නායං ධම්මෝ මහිච්ඡස්සං සංතුට්ඨස්සායං ධම්මෝ නායං ධම්මෝ අසංතුට්ඨස්ස"

- පහසුවෙන් පෝෂණය කළ හැකි බව (සුභරතාව)

- මේ සඳහා අල්පකෘත්‍යතාව මෙන් ම සැහැල්ලු ගති පැවතුම් පැවැතීම ඉතාම වැදගත් වේ.

- මිනිසා ආහාරපාන,නිවාස ඇඳුම් පැළඳුම් ආදී මූලික අවශ්‍යතා අවම ප්‍රමාණයෙන් ලැබ පෝෂණය ලැබීම සුභරතාවට අයත්වන බව

- අල්ප ආශාවන්ගෙන් යුක්ත පුද්ගල ජීවිතය පහසුවෙන් පෝෂණය කළ හැකි එකක් වන බව

- වර්තමාන සමාජයේ බොහෝ ගැටලු නිර්මාණය වී ඇත්තේ මෙම සංකල්ප වලින් බැහැරව ක්‍රියාකිරීම හේතුවෙනි.
- සම්පත් ගොඩගසා ගැනීමේ නොතිත් ආශාව, අනුන් පරයා නැගී සිටීමේ අවශ්‍යතාව, අවිචාරශීලී ධන පරිභෝජනය, ප්‍රදර්ශන කාමය, අත්තුක්කංසනය, පරවම්භනය වැනි මනෝභාවයන්, ඉන්ද්‍රිය පීනනයෙන් තෘප්තිමත් නොවීම හේතු කොටගෙන සමාජය තුළ මනුෂ්‍ය ඝාතන, කාම අපරාධ, ගෘහස්ථ ආරවුල්, පරිසර දූෂණයට අදාල බොහෝ ගැටලු වර්තමානයේ නිර්මාණය වී ඇත්තේ මෙම සංකල්පවලින් බැහැරවීම නිසාය.
- කහවනු වැස්සක් වැස්සද මිනිසා තෘප්තිමත් නොවන බව (නකාහපන වස්සේන තිත්ථිකාමේසු විජ්ජති)

- ඇවිලෙන ගින්නට කොතරම් දර දැමුවත් සෑහීමක් නැත. ඇළදොළ ගංගා මගින් කොතරම් ජලය ගලා ආවත් මුහුදට ඇතිවීමක් නැත. ආශාවේ සීමාවක් නොදන්නා මිනිසාට කොතරම් වස්තුව ලැබුනත් ප්‍රමාණවත් නොවන බව දහමෙහි දැක්වෙන ඉගැන්වීම තුළින් ද මෙම සංකල්පන්ගේ ස්වභාවය අර්ථ ගැන්වෙන බව.
  (අග්ගික්ඛන්දෝ සමුද්දෝව මහිච්ඡෝචාපි පුග්ගගෝ
  සකටෙනපච්චයං දෙන්තු තයෝ පේතේ අතප්පියා)

- මෙම සංකල්ප තුළින් පුද්ගල සන්තානගතව පවතින ලෝභය, ඊර්ෂ්‍යාව, ආශාව, රාගය, තෘෂ්ණාව, මානය,ක්‍රෝධය, වෛරය, පළිගැනීම ආදී දුර්ගුණ පාලනය කරගැනීමේ හැකියාව ඇතිවේ.

- මෙම සංකල්ප භාවිතයට ගැනීම තුළින්
  - පැවැත්ම චාම් වේ
  - පුද්ගල ගැටුම් අවම වේ
  - මානසික සහනය වර්ධනය වේ
  - අධාර්මික රැකියාවලින් ධනවත්වීම වීමට අපේක්ෂා නොකිරීම, අධාර්මික ක්‍රියා නොකිරීම,හේතුකොට ගෙන සාමකාමී සමාජයක් නිර්මාණය වේ.
  - ආත්ම විමුක්තියට උපකාරී වේ

05 - II. බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලා ද පරිසර සෞන්දර්ය අගය කොට ඇති ආකාරය උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

- සෞන්දර්ය යනු ඉන්ද්‍රියයන් හා මනස ප්‍රසන්න බවට පත් කරන සුන්දර වූ දෙයයි. සුන්දරත්වය දරා සිටින ස්වභාවය යි.
- බුදුදහම ත්‍රිලක්ෂණය මුල්කොටගත් දහමක් නිසා ලෞකිකත්වයට තැන දෙන සෞන්දර්ය සංකල්ප ප්‍රතික්ෂේප කරන බව බටහිර විචාරකයන් පැවසුව ද බුදුදහම සෞන්දර්ය සංකල්පය ප්‍රතික්ෂේප නොකරන බව
- ස්වාභාවික පරිසරය තුළ දීම බුදුරදුන්ගේ තෙමඟුල සිදු වූ අතර උන්වහන්සේ ස්වභාව සෞන්දර්ය රසවින්දනය කළ බව අරියපරියේසන හා මහා පරිනිබ්බාන ආදි සූත්‍රවල දැක්වෙන බව
- මහරහතන් වහන්සේලා භාවනාව මගින් ලැබූ කායික හා මානසික සැහැල්ලුව ඇතිව නිකෙලෙස් ඇසින් සුන්දරත්වය වින්දනය කළ බව ථෙර ගාථාවන්ගෙන් පැහැදිලි වන බව

- බුදුරජාණන් වහන්සේගේ උපත, බුද්ධත්වය, මංගල ධර්මය දේශනය, පිරිනිවන් පෑම වැනි ජීවිතයේ සෑම වැදගත් සිදුවීමක් ම ස්වාභාවික පරිසරය ඇසුරෙහි සිදු විය.

- අරියපරියේසන සූත්‍රය, මහාපරිනිබ්බාන සූත්‍රය යනාදිය බුදුරදුන් ස්වභාව සෞන්දර්ය විඳි බවට නිදසුන්ය

- මහාපරිනිබ්බාණ සූත්‍රය

  "රමණීයා ආනන්ද වෙසාලී, රමණීයං උදෙන චේතියං, රමණීයං ගෝතමක චේතියං, රමණීයං සත්තම්බක චේතියං, රමණීයං බහුපුත්තක චේතියං, රමණීයං සාරන්දදං චේතියං, රමණීයං චාපාල චේතියං"

- බුදුරජාණන් වහන්සේගේ සිත් ගත් ස්ථාන ලෙෂ

  විසල් පුරය, උදේන, ගෝතමක, සත්තම්බක, බහුපුත්තක, සාරන්ද්දද, චාපාල වැනි ස්ථාන

- **සංයුත්ත නිකායේ දේවතා සංයුත්තය**

  "නතේ කාමා යානි චිත්‍රානි ලෝකේ
  සංකප්පරාගෝ පුරිසස්සකාමෝ
  තිට්ඨන්ති චිත්‍රානි තථේව ලෝකේ
  අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං" යනුවෙනි

ලොව විසිතුරු දේ කාම වස්තු නො වේ. කාමය වන්නේ පුද්ගලයා තුළ පවතින්නා වූ රාගය යි. ලොව විසිතුරු දෑ එලෙස ම පවතී. විතරාගී උතුමෝ ඒ කෙරෙහි ආශාව දුරු කරති.

- මින් පැහැදිලි වන්නේ ලොව පවත්නා විසිතුරු දේ විසිතුරු අයුරින් දැකීමට බුදුදහම ඉගැන් වූ බව යි. සුන්දර දෙය සුන්දර ව දැකීම සෞන්දර්ය විරෝධී නො වේ.

## ❖ කාළුදායී ථෙරගාථාව

අංගාරිනො දානි දුමා භදන්තෙ - ඵලෙසිනො ඡදනං විප්පහාය
තෙ අච්චිමන්තොව පභාසයන්ති - සමයො මහාවීර භාගී රසානං

දළුදාල මල් පිපිල ගිනි අඟුරු වගේ ගස්
කොළ හැලිලා පලගන්ට ලංවෙලා හිමියනේ
විසල්තුරු බබලන්නෙ පහන්සිළු වගේමයි
වීරයනි නෑයන්ට පිහිටවීමට කාලයයි

දුමානි ඵුල්ලානි මනෝරමානි - සමන්තතෝ සබ්බදිසා පවන්ති
පත්තං පහාය ඵලමාසසානා - කාලෝ ඉතෝ පක්කමනාය වීර

මල් පිපිල ගස් පිරිල බලන්නට ලස්සනයි
පරණ පත් හැර දමා පලගන්ට සැරසිලා
හාත්පස හැමතැනම මල් සුවඳ විහිදයයි
වීරයනි පිටවෙන්නන් හොඳම කාලයයි

- අජකරණී නදිය අසබඩ වැඩ සිටි සප්පක තෙරුන් වහන්සේ එහි සිට විඳි චමත්කාරය පිළිබඳ ව උදම් ඇනූ බව

  යදා බලාකා සුචිපණ්ඩරච්ඡිදා
  කාලස්ස මේඝස්ස භයෙන තජ්ජිතා
  පලෙහිති ආලයමාලයෙසිනි
  තදා නදී අජකරණී රමෙති මං

  කළු වලා පෙළ බලා
  බියට පත් කොක් රෑණ
  තම නිවෙස් සොයා ගෙන
  සුදු පියාපත් විදා
  අහස් නැග පියාඹන
  නදිය අජකරණී
  මහද ඇද බැඳගනී

- කළු පැහැති ගන වළා පෙළ දැක බියට පත් වූ කොක් රෑන සුදු පැහැති තම පියාපත් විදහා අහසට නැගී තම නිවෙස් කරා පියඹා ගියහ. නමුත් නිහඬව හුදෙකලාව ගලා යන අජකරණී නදිය මගේ හදවත පැහැරගෙන ඇත.

එදා කොකුන් සුදු පියා විදාලා
බයෙන් තැවී කළු වලා පෙනීලා
අහස් නැඟී යන නිවෙස් බලාලා
අජකරණී ගඟ මා සිත ගත්තී

❖ භාවනාව මඟින් ලැබූ කායික හා මානසික සැහැල්ලුව නිකෙලෙස් ඇසින් වින්දනය කළ බව තාලපුට තෙරුන්ගේ උදානයෙන් පැහැදිලි වේ.

සුනීලගීවා සුසිඛා සුපෙඛුනා
සුචිත්තපත්තච්ඡදනා විහංගමා
සුමඤ්ජුඝොසත්ථනිතාභි ගජ්ජිනෝ
තෙතං රමෙස්සන්ති වනම්හි ඣායිනෝ

නීල වර්ණ ගෙල ඇත්තා වූ, මනාව පිහිටි සිලු ඇත්තා වූ, පිල්බර වූ, විසිතුරු පියාපත් ඇත්තා වූ පක්ෂීහු මේඝ ගර්ජනා හේතුවෙන් මිහිරි හඬින් නාද කරන්නාහු ය. එය ධ්‍යාන වැඩීමට බාධාවක් නොවේ.

❖ ගිරිමානන්ද තෙරුන් වහන්සේගේ උදානයෙන් ද සෞන්දර්ය රසාස්වාදය කළ බව

වස්සති දේවො යථා සුගීතං - ඡන්නා මේ කුටිකා සුඛා නිවාතා
තස්සං විහරාමි වූපසන්තෝ - අථ චේ පත්ථයසී පවස්ස දේව

මනා ගැයුමක් ලෙසින් වැහි වසී
මගේ කුටිය සුව එළවයි
වැසූ දොර කවුළුවෙන්
වාත පීඩා නොයේ.
සන්හිඳුනෙමි වෙසෙමි මම්
මේඝය ඉදින් රිසි නම් වැසි වසිනු මැන
වැසි වසී මනා ගී ගැයුමක් ලෙසින්

වැස්ස වහින්නේ ලස්සන ගීතයක් ලෙසිනි. මාගේ මේ කුටිය මැනවින් සෙවෙලි කර ඇත. එහෙයින් මට සුවය ලැබේ. වාත පීඩා ද නැත. ජනේලය වසා ඇත. සන්සිඳුණු සිතින් මම වෙසෙමි. ඉතින් වැස්ස කැමති නම් රිසි සේ වසින්න.

05 (i) අල්පේච්ඡතාව සන්තුට්ටිය හා සුභරතාව යන සංකල්පවල කාලීන වැදගත්කම පිළිබඳ ධර්මානුකූල විවරණයක් කරන්න. (ලකුණු 10)

(ii) බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලාද පරිසර සෞන්දර්ය අගයකොට ඇති ආකාරය උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06). I. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල බුදුදහමේ චිරස්ථිතියට හා ව්‍යාප්තියට හේතු වූ අයුරු පෙන්වා දෙන්න.

- බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 පසුව
- **මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ** ප්‍රධානත්වයෙන් **අශෝක රජුගේ** අනුග්‍රහයෙන්
- **පැළලුප් නුවර අශෝකාරාමයේ** මෙම සංගායනාව සිදුකරන ලදි.
- **දහසක් භික්ෂූන් වහන්සේලාගේ** සහභාගීත්වයෙන් **නවමසක්** පුරා සංගායනාව සිදු කෙරිණි.
- මෙය සහාස්සිකා සංගීතිය යනුවෙන් ද හඳුන්වනු ලබයි.

06). I. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල බුදුදහමේ චිරස්ථිතියට හා ව්‍යාප්තියට හේතු වූ අයුරු පෙන්වා දෙන්න.

තෙවන සංගායනාව පැවැත්වීම විෂයයෙහි බලපෑ හේතු

1 නිකාය භේදය වර්ධනය වී තිබීම

2 අධර්මවාදින් සසුනට ඇතුළු වී සිටීම

3 රාජ්‍ය පාලකයෙකුගේ සහාය හා ආරක්ෂාව නොමැතිවීම

4 විනයකර්ම කිරීමේ දි ගැටලු පැනනැඟීම

## ප්‍රතිඵල

- භික්ෂු වේෂය ගත් දුසිල් මහණුන් හැට දහසක් හඳුනාගෙන සසුනෙන් නෙරපා ශාසන පාරිශුද්ධිය ඇති කිරීම

- අවුරුදු හතක් තිස්සේ සිදු නොකරන ලද විනය සිදු කිරීම මෙම සංගායනාවෙන් පසු නැවතත් ආරම්භ වීම

- පරවාදී මත පන්සියයක් ඛණ්ඩනය කොට ස්වකීය මත පන්සියයක් ස්ථාපිත කරමින් මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ කථාවත්ථුප්පකරණය සකස් කිරීම

- කථාවත්ථුප්‍රකරණය අභිධර්ම පිටකයට අයත් වන අතර, එය සකස් වීමත් සමඟ ම අභිධර්ම පිටකය සම්පූර්ණ වීම

❖ ඒ සමඟ ම අභිධර්ම පිටකය සම්පූර්ණ වීම එනම්,

1. ධම්මසංගණීප්පකරණය
2. විභංගප්පකරණය
3. ධාතුකථාප්පකරණය
4. කථාවත්ථුප්පකරණය
5. යමකප්පකරණ
6. පට්ඨානප්පකරණය
7. පුග්ගල පඤ්ඤත්තිප්පකරණය යනුවෙනි.

❖ බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද සියලුම ධර්මය සූත්‍ර, විනය, අභිධර්මය යනුවෙන් ත්‍රිපිටකය ලෙස පරිපූර්ණත්වයට පත්වීම

- බුදු සමයේ දේශාන්තර ව්‍යාප්තිය පිණිස කටයුතු සැලසීම
- භාරත දේශයට පමණක් සීමා වී තිබූ බුදු දහමේ පණිවිඩය දේශාන්තර ව්‍යාප්තියට කටයුතු
- දක්ෂ, ධර්ම කථික, සිල්වත්, බහුශ්‍රැත, උපසම්පන්න භික්ෂූන් කණ්ඩායම් නවයක් තෝරා ගෙන බුදුදහම ප්‍රචාරය කිරීම

# බෞද්ධ ශිෂ්ටාචාරය - උපකාරක සම්මන්ත්‍රණය - 2022

| වැඩම කළ රටවල් | ප්‍රධාන ධර්ම දූතයන් වහන්සේ | දේශිත සූත්‍ර |
|---|---|---|
| 1. කාශ්මීර ගන්ධාරය | මජ්ඣන්තික හිමි | ආසිවිසෝපම සූත්‍රය |
| 2. මහිස මණ්ඩලය | මහාදේව හිමි | දේවදූත සූත්‍රය |
| 3. වන වාසී දේශය | රක්ඛිත හිමි | අනමතග්ග සූත්‍රය |
| 4. අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත හිමි | අග්ගික්ඛන්ධෝපම සූත්‍රය |
| 5. මහාරාෂ්ට්‍රය | ධම්මරක්ඛිත හිමි | මහා නාරද ජාතකය |
| 6. යෝනක දේශය | මහාරක්ඛිත හිමි | කාලාම සූත්‍රය |
| 7. හිමවත් පෙදෙස | මජ්ඣිම හිමි | දම්සක්පැවතුම් සූත්‍රය |
| 8. ස්වර්ණභූමිය | සෝන සහ උත්තර දෙදෙනා | බ්‍රහ්මජාල සූත්‍රය |
| 9. තම්බපණ්ණි | මිහිඳු හිමියන් | චුල්ලහත්ථිපදෝපම සූත්‍රය |

06. (II) භාරතයේ පැවැති ප්‍රකට පැරණි බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදුවූ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඇගැයීමට ලක් කරන්න. (ලකුණු 10)

- දෙස් විදෙස් කීර්තියට පත් මහා ප්‍රඥයන් බිහිවීම
- විශ්වවිද්‍යාල තුළ පුළුල් ධර්ම ඥානයක් ලබා දීමට හැකි සුවිශේෂී පඬිවරුන් බිහිවීම
- නාලන්දා විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වූයේ කුලපතිය
- හියුංසියැන් පැමිණෙන විට නාලන්දාවේ කුලපති තනතුරු දැරූ සීලභද්‍ර හිමි ජගද්දලා විශ්වවිද්‍යාලයේ ශිල්ප හැදෑරූ අයෙකි.
- දීපංකර ශ්‍රී ඥාන හිමියන් මහායාන ධර්මය හදාරන ලද්දේ ඔදන්තපුර විශ්වවිද්‍යාලයෙනි
- පසුව එම හිමි වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ කුලපති බවට පත්වීම
- හියුංසියැන් පාහියන් ඉට්සිං තාරානාත් වැනි දේශගවේෂණයේ ප්‍රමුඛ පිරිස් බිහිවීම

- සීලභද්‍ර තෙරුන්ගේ ශිෂ්‍යයකු වූ දාන සීල තෙරුන් ද ජගද්දලා විශ්වවිද්‍යාලයේ ශිල්ප හදාරා ඇති අතර උන්වහන්සේ මහායාන ධර්ම ග්‍රන්ථ හැටක් පමණ එම විශ්වවිද්‍යාලයේ ටිබෙට් බසට පරිවර්තනය කිරීම
- පුළුල් විෂය ක්ෂේත්‍රයක අවබෝධයක් ලබාදීම
- ධර්ම ග්‍රන්ථ සම්පාදනය කිරීම.
- ඉට්සිං වසර දහයක් නාලන්දාවේ රැදෙමින් ගාථා ලක්ෂ පහක් ඇති සංස්කෘත පොත් හාරසියයක් සම්පාදනය කිරීම
- දෙස් විදෙස් ධර්ම ප්‍රචාරක සේවාවක් සිදු වීම
- හියුංසියෑන් වසර 15ක් නාලන්දාවේ ආචාර්යවරයෙකු වශයෙන් සේවය කළ චීන ජාතික හිමිනමකි. එම හිමියන් මගින් රට රටවලට ධර්මය ව්‍යාප්තවීම.

06 (i) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල බුදුදහමේ චිරස්ථිතිය හා ව්‍යාප්තියට හේතු වූ අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10)

(ii) භාරතයේ පැවැති ප්‍රකට පැරණි බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදුවූ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඇගැයීමට ලක් කරන්න. (ලකුණු 10)

07 (i) අභයගිරි විහාරයේ ප්‍රභවය මෙරට ශාසනික ගැටලු උද්ගතවීමට මෙන්ම සංස්කෘතික ප්‍රවණතාවක් උදාකරලීමට ද හේතුවූ අයුරු විමර්ශනය කරන්න. (ලකුණු 10)

## අභයගිරි විහාරයේ ආරම්භය

- ක්‍රි. පූ. පළමු සියවස තෙක් මෙරට වාසය කළේ මහාවිහාරය මුල්කරගත් භික්ෂූන් වහන්සේලා ය.
- වට්ටගාමිණීඅභය රජු දෙවනවර බලයට පත්වීමෙන් අනතුරුව ගිරි නිඝණ්ඨාරාමය බිඳදමා එම ස්ථානයෙහි ගොඩනැගූ ආරාමය කුපික්කලතිස්ස හිමියන්ට පූජාකළ බව
- මෙය අභය විහාරය, අභයුත්තර විහාරය, උත්තර විහාරය නමින් ද හැඳින්වේ.

- පසු කාලයේදී අභයගිරිය වෙනම ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වූ බව
- පසුව ඉදිකළ සෝමාරාමය, දක්ඛිණගිරි විහාරය, සාලියාරාමය මෙයට ඇතුළත් විය.
- අභයගිරිය වජ්ජිපුත්තක නිකායට අයත් ධර්මරුචි හිමියන්ගේ අදහස් පිළිගෙන ක්‍රියාත්මක වූ බව
- වජ්ජිපුත්තක හා වෛතුල්‍යවාදී මත ඉදිරිපත් කරමින් මහායානික අදහස් ද අභයගිරිය හරහා ක්‍රියාත්මක වූ බව

## සංස්කෘතික ප්‍රවණතා

- නව දාර්ශනික සංකල්ප පිළිගැනීම හා නව මගකට යොමුවීම
  උදා: බෝධිසත්ත්ව සංකල්පය
- විවිධ පුද පූජා ආරම්භ කිරීම
  ජය පිරිත, සීවලී පිරිත, ගිනි පිරිත, ජලනන්දන පිරිත,
  දළදා පූජාව හා පෙරහැර ආරම්භ කිරීම
- අභයගිරි ස්තූපය ගොඩනැංවීම
- මහායාන ධර්මය රන් පත්, තඹ පත් ආදියෙහි ලියා චෛත්‍යවල තැන්පත් කිරීම

- ප්‍රතිපත්ති පූජාවට වඩා ආමිස පූජාවට මුල් තැනක් ලබාදීම
- භක්තිවාදය ප්‍රචලිත කිරීම තුළින් පූජා සංස්කෘතියක් ස්ථාපිත කිරීම

  - බෝධියට නහනුමුර පූජා පැවැත්වීම
  - බෝධිසත්ත්ව ප්‍රතිමාවලට රාජාභරණ පැළදවීම
  - බුද්ධ රූප අභිෂේක කිරීම

- කලාත්මක ක්ෂේත්‍රයේ වර්ධනයට කටයුතු කිරීම

  අලංකාර ගෘහනිර්මාණ, මූර්ති, කැටයම්, පොකුණු ආදිය නිර්මාණය කිරීම

  උදා:-

  - රත්නප්‍රාසාදය වැනි අලංකාර විහාර මන්දිර ඉදිකිරීම
  - සුවිශාල දානශාලා ඉදිවීම
  - කලාත්මක බවින් අනූන බුද්ධ ප්‍රතිමා නිර්මාණය වීම
  - අලංකාර සඳකඩපහණ, පොකුණු නිර්මාණය වීම

- ග්‍රන්ථ රචනා කිරීම තුළින් අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති කිරීම

  උදා:-

  - විමුක්ති මාර්ගය
  - සද්ධම්මෝපායනය වැනි ග්‍රන්ථ

- මහායාන ග්‍රන්ථ තැන්පත් කිරීමට ධාරණී ගෘහ නිර්මාණය
- පුරාවිද්‍යාව, වෛද්‍ය ශාස්ත්‍රය, පෙයෝතිෂය, කතාව, ගෘහනිර්මාණ ශිල්පය වැනි ලෞකික විෂය ධාරා උගන්වන ආයතනයක් වීම.

- මූලායතන මගින් අධ්‍යාපන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වීම

  උත්තරමූල

  උතුරුමුල විජයබා රජු ද්‍රවිඩයින් සමග කළ සටනේදී අභයගිරිය උදව්කළ නිසා මෙය කරදුන්බව

  මහනෙත්පා මූල

  මහානේත්‍රප්‍රාසාද මූලය 4වන අග්‍රබෝධි රජතුමා කළ බව (ශ්‍රී රාහුල හිමියන් මෙයට අයත් වූ බව)

  කපාරා මූල

  දෙවන දාඨෝපතිස්ස රජු දවස ආරම්භ වූ බව

  වහදු මූල

  5 වැනි අග්බෝ රජු ධර්මරුචි නිකායකයින්ට කරදුන් බව (සූත්‍ර හා අභිධර්ම භාණක භික්ෂූන් වහන්සේලා මෙහි විසූ බව)

07 (ii) ථායි ජන ජීවිතය පෝෂණය කිරීමෙහිලා බුදුදහමෙන් ලද ආභාසය පැහැදිලි කරන්න. (ලකුණු 10)

- බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයට යටත් නොවූ ආසියාවේ එක ම රට වූ තායිලන්තය වේ. නිදහස් දේශය යන නමින් විරුදාවලියට පත් වන අතර එය අතීතයේ සියමය ලෙස ද හඳුන්වා ඇත.
- තෙවන ධර්ම සංගායනාවෙන් පසුව නව රට සසුන් පිහිටුවීමේ දී ස්වර්ණ භූමියට වැඩම කළ සෝණ - උත්තර හිමිවරුන් විසින් තායිලන්තයට බුදුසමය හඳුන්වා දෙන ලදැයි එරට ජනතාවගේ පිළිගැනීම වේ.
- යුග හතරක් ඔස්සේ තායිලන්තයේ බුදුදහම ව්‍යාප්ත වූ බව

- ක්‍රි.පූ. 329 දී නකොම් පටොම් නගරය ආශ්‍රිත ව ථෙරවාදී බුදුදහම ව්‍යාප්ත ව පැවති බවට සදක හමුවේ.
- ඉතිහාසගත ව සඳහන් වන අතර මින් සියවස් කිහිපයකට පසු ව බැංකොක් නගරයට
- බටහිරින් පිහිටි පොංටන් හා පාපයෝම් යන ස්ථානයන්හි දී හමු වී බෞද්ධ පුරාවස්තු මඟින්
- පළමු යුගයට අදාළ තොරතුරු තහවුරු වේ.
- දෙවන යුගයෙහි ආරම්භය ලෙස සැලකෙන ක්‍රි.ව. 700 දී පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්ත වූ අවධිය ලෙස සැලකේ
- ක්‍රි.ව. 11 වන සියවසෙහි බුරුමයෙහි පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් බුද්ධ ධර්මය ව්‍යාප්ත වීම තෙවන අවධිය ලෙස පෙන්වා දිය හැකිය

- ශ්‍රී සූර්යවංශ රාම මහා ධාර්මික අධිරාජතුමන් ක්‍රි.ව. 1361 දී සියම් භික්ෂු පිරිසක් ලංකාවට එවා මෙරට දී බුදුදහම මැනවින් ඉගෙන ගැනීමෙන් අනතුරු ව නැවත එරටට ගෙන්වා ගෙන බුදු දහමේ ව්‍යාප්ත කිරීම හතර වන අවධිය ලෙස පෙන්වාදිය හැකිය.
- හියුංසියැංගේ වාර්තාවලට අනුව ක්‍රි.ව. 7 වන සියවසේ ද්වාරවතී රාජ්‍යයේ බුදුසමය සමෘද්ධිමත් ව පැවති සාදක හමුවේ.
- මොන්කුත් රාජ්‍ය සමයේ සියම් නිකාය පමණක් පැවති අතර පසු ව මෙම නිකාය මහා නිකාය හා ධම්ම යුත්තික නිකාය වශයෙන් කොටස් දෙකකට වෙන් වූ බවට සාදක දැකිය හැකිය.

## ථායි සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වීම

- බුදුදහම නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍ය යුතුකමක් ලෙස සැලකෙන අතර රජයේ ප්‍රධානයා බෞද්ධයකු විය යුතුය.
- බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත් වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දැරිය යුතුය.
- ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානියා රජය විසින් පත් කරන ලද සංඝ රාජයන් වහන්සේ නමකි.
- ථායි පිරිමින් ටික කලකට හෝ පැවිදි වී සිටීම චිරාගත සම්ප්‍රදායයක් වන අතර පැවිදි වීම හා උපැවිදි වීම උත්වශ්‍රීයෙන් සිදුවන බව ද, එම තාවකාලික පැවිද්දේ දී හමුවන සහතිකය විවාහ වීමේ දී හා රැකියා ලැබීමේ දී විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- මනා ගිහිපැවිදි සම්බන්ධතාවක් පවතින අතර තායි භික්ෂූන් වහන්සේගේ ශිෂ්‍යයන් තුළ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර ම ලෞකික ජීවිත ගැටලුවලට ද විසඳුම් සැපයීම සිදු කරන බව පැහැදිලිය.
- ථායි ජනතාව දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කරගෙන එම පූජා කටයුතුවල නිරත වන්නේය.
- ථායි රටේ ලොකු කුඩා සැම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැලඳගෙන සිටීම සුලබ දසුනක් වන අතර එය සකස් කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේ විසින්ය.
- ථායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන් ම බහුල ව ළමයින් ද වාසය කරයි.

- වාර්ෂික ව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ තැනක් ගන්නා බවත් කඨින චීවරය ගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විත වේ.
- ථායි රජතුමා කිසියම් විහාරයක කඨින පිංකමකට සම්බන්ධවීම අනිවාර්ය අංගයක් වේ.
- අධ්‍යාපනය කලා ශිල්ප හා සාහිත්‍යය ද බුදුදහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණය කරලීමට දායකත්වයක් ලබාදී ඇති බව පැහැදිලිය.

07 (i) අභයගිරි විහාරයේ ප්‍රභවය මෙරට ශාසනික ගැටලු උද්ගතවීමට මෙන්ම සංස්කෘතික ප්‍රවණතාවක් උදාකරලීමට ද හේතුවූ අයුරු විමර්ශනය කරන්න. (ලකුණු 10)

(ii) ථායි ජන ජීවිතය පෝෂණය කිරීමෙහිලා බුදුදහමෙන් ලද ආභාසය පැහැදිලි කරන්න. (ලකුණු 10)

08 (i) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සැකෙවින් දක්වා ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන්හි වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

- **බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර විවිධ සංකේත භාවිත කිරීම**
  **උදාහරණ : බෝධිය, ස්තූපය, ධර්මචක්‍රය, ශ්‍රී පාදය, පද්මය**

- **විවිධ හේතු සාධක මත බුද්ධ ප්‍රතිමා නිර්මාණය ප්‍රමාදවීම**
  **උදාහරණ : බුදුරජාණන් වහන්සේ අප්පටිම ලෙස දක්වා තිබීම**
  **දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රයේ ඉගැන්වීම්**
  **අංගුත්තර නිකායේ ද්‍රෝණ සූත්‍රයේ ඉගැන්වීම්**


- බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ ව ඇති සාහිත්‍යය මතවාද
    - කෝසලබිම්බ වර්ණනාව
    - දිව්‍යාවදානය
    - වංසත්ථප්පකාසිනී
    - භ්‍රමණවෘත්තාන්තය

- බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ ව ඇති පුරාවිද්‍යාත්මක සාදක
- මෝඑස්ගේ (Moes) කාසි - ක්‍රි. පූ. 90 -75
- රාජ හෝ දේව රූප විය හැකි බව
- බීමරාන් කරඬුව (Beemeran)
- කණිෂ්ක රජුගේ කාසි
- ෂාජි කිඩෛරි  කරඬුව (shajikie Tehrihie)



# ඉන්දියාවේ ප්‍රධාන කලා සම්ප්‍රදායයන්


- ගන්ධාර කලා සම්ප්‍රදාය
- මථුරා කලා සම්ප්‍රදාය




# ගන්ධාර කලාව

- ව්‍යාප්තිය : වයඹදිග පළාත්වල සිට ඇෆ්ගනිස්ථානය දක්වා
- කාලය : ක්‍රි.පූ. 1 - ක්‍රි.ව. 5
- ආභාසය : ග්‍රීක රෝම කලාව
- පූර්වාදර්ශය: ඇපලෝ දෙවියන්






❖ මථුරා කලාව

- ව්‍යාප්තිය : නවදිල්ලිය හා අග්‍රා නගරය අතර යමුනා ගංතීරයෙහි
- පූර්වාදර්ශය : යක්ෂ රූප දේශීය ශෛලිය

## ගන්ධාර බුද්ධ ප්‍රතිමාවල ලක්ෂණ

1 මහාකාරුණික ලීලාව දක්වයි.
2 ආභංග හෙවත් මදක් නැමුණු කෝමල සිරුර නිරූපණය කරයි.
3 අත් සංවර ව සිරුරට සමීපව ඇත.
4 නෙත් අඩවන් ය. තොල් සිහින් ය. පරිමානුකූල කම්මුල් ඇත.
(මනාව සැකසුණු කම්මුල්වලින් යුක්ත ය)
5 හිසකේ ස්වාභාවික ය.
6 සිවුර ග්‍රීක ටෝගාවකට සම ය.
7 බොහෝවිට සිවුර දෙවුරම වැසෙන සේ දක්වා ඇත.
8 ග්‍රීක ඇපලෝ දෙවියන් පූර්වාදර්ශ කරගෙන තිබේ.

9 පද්මාසනය, කුඩා නෙළුම් මලක් මත දුෂ්කර ව වැඩ සිටින විලාසයකි.

10 උෂ්ණීෂය ග්‍රීක සූර්ය දේවතාවාගේ මකුටය හෙවත් හිසකෙස් රොදට සමාන ය.

11 ඌර්ණ රෝමය හා දික්වූ කන්පෙති ඇත.

12 නාසය දික්ව ඍජුව සකස් කර ඇත.

13 සමරූපතාව බොහෝ විට දක්නට නැත.

14 පුළුල් සිරුර දෙස බලනවිට අත්පා කෙටිව සකස් වී ඇත.

15 හිස පිටුපසින් කවාකාර රශ්මි මාලාවක් දක්වා ඇත.

16 බුදුරජාණන් වහන්සේගේ බාහිර රුව අලංකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට තිබේ. ගුණ නිරූපණයට සමත් වී නැත.

# මථුරා බුද්ධ ප්‍රතිමාවල ලක්ෂණ

1 ශාක්‍ය සිංහ ලීලාව දක්වයි. ඇතැම් විට පාමුල සිංහ රූවක් ඇත.
2 සමභංග හෙවත් ඍජු ව දෙපා මදක් දුරස් කොට තබාගෙන ඇත.
3 අත් සිරුරට ඈත් ය. ඇතැම් විට ඉණට අත් ගසා ගත් අයුරු දැක්වේ.
4 තොල් මහත් ය. කම්මුල් පිම්බී ඇත.
4 හිසකේ ශෛලිගත ය. කැරලි ගැසී ඇත.
5 විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුරකි. රැලි අඩු ය.
6 සිවුර වම් උරහිස වැසෙන සේ දක්වා ඇත.
7 සිවුරෙහි රැළි උඩුකය මත පමණක් පෙන්වා ඇත.

8 අඳනය පටියකින් සිරකොට බැද තිබෙන ආකාරය පෙන්නුම් කරයි.

9 උෂ්ණීෂය දක්වා ඇත්තේ සම්පූර්ණයෙන් ම මුඩු කරන ලද හිසෙහි හරිමැද හක් බෙල්ලෙක් නැතහොත් ගොළුබෙලි කටුවක් යටි අතට තබා තිබෙන ආකාරයට ය.

උදාහරණ : කත්‍රා හා අහිච්ඡත්‍ර බුද්ධ ප්‍රතිමා

10 මුඩුකළ හිස මැද උඩට නෙරාගිය මාංශමය බුබුලක් ලෙස ද උෂ්ණීෂය නෙළා ඇත.

11 ඌර්ණ රෝමය දැක්වීමට නලළෙහි උස් තිතක් තබා ඇත.

12 පද්මාසනය, නෙළුම් මල මත පහසුවෙන් වැඩ සිටින විලාසයකි.

13 බුදුරජාණන් වහන්සේගේ ගුණ නිරූපණය කිරීමට වැඩි අවධානයක් යොමු කර තිබේ.

08 (ii) සිංහල ජනකවියේ පෝෂණයට බුදුදහමෙන් ලැබුණු ආභාසය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

- පැරණි ජන සමාජය පන්සල ඇසුරෙන් බණ දහම් ඉගෙන ගත් බව
- කුසල් - අකුසල්, හොඳ - නරක, පින් - පව් නිර්ණය කිරීමේදී එසේ ලබාගත් දැනුම උපකාරී කරගත් බව
- තම තමන්ගේ ජීවන වෘත්තීන්වලදී ද එම කරුණු කෙරෙහි සැලකිල්ලක් දැක්වූ බව

- ජීවන වෘත්තීන්හි නිරතවන විට දැනුන දුක, මහන්සිය ආදිය නිවා ගැනීම සඳහා ගායනා කළ ජනකවිය තුළින් එය තහවුරු වන බව

උදාහරණ : පැල් කවි, පතල් කවි, ගැල් කවි, පාරු කවි, නෙළුම් කවි

❖ තමා විඳින දුක්ගැහැට පෙර භවවල කරන ලද අකුසල කර්මවල ප්‍රතිඵලයක් බව

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදාද මවුපියෝ දකින්නට

(ගැල් කවි)

- තන්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා
  කටු කැලේ ගාල නොලිහා වද දෙනවා
  හපුතලේ කන්ද දැකලා බඩ දනවා
  පව්කළ ගොනෝ අදපන් හපුතල් යනවා

- දෙමාපිය දූදරු සම්බන්ධතාව

මල්ලියේ ඔහොම නොකරන් අපෙ අම්මාට
දෙතනේ කිරි දුන්නෙත් අපි දෙන්නාට
තියෙන දෙයක් දෙන්නෙත් අපි දෙන්නාට
බුදුන් වදින ලෙස වැඳපන් අම්මාට

- මරණින් මතු නිවන අපේක්ෂා කිරීම

මං බාලේ ඇති කළ තලගොයි පැටියා
මගෙ තනියට උං මිදුලේ කෙළ සිටියා
නපුරු සතෙක් ඇවිදින් උං අරන් ගියා
නිවන්පුරේ පලයන් තලගොයි පැටියා

❖ නරකාදිය පිළිබඳ අදහස් - (බඹර කවි)

අම්මා පල්ලා බඹරුන් අත වරද නැතී
කැලේ තියෙන මල් කාලා උන් රැකෙතී
අනුන් කරන ගොවිතැනකට හානි නැතී
බඹර කපන අය නරකාදියේ යතී

## ❖ බුදුන් දැකීමේ පරමාර්ථ (ගොයම් කවි)

කල්බලා නොවෙද ගොවිතැන් කරන්නේ
වල් මරා නොවෙද කිරිවද පැසෙන්නේ
පච්කලා නොවෙද වැසි පල නොදෙන්නේ
ලොව්තුරා බුදුන් කවදද දකින්නේ

## ❖ පාරු කවි

ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා වරෙන්
සාධුකාර දී ඔරුවක නැගී වරෙන්

08 (i) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සැකෙවින් දක්වා ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන්හි වෙනස්කම් පැහැදිලි කරන්න (ලකුණු 10)

(ii) සිංහල ජනකවියේ පෝෂණයට බුදුදහමෙන් ලැබුණු ආභාසය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

# තෙරුවන් සරණයි..!